# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,224 - 2021 අප්‍රේල් මස 16 වැනි සිකුරාදා - 2021.04.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 322 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 325 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මැයි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

321- B 082222 — 353 (2021/04)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

1994 අංක 9 දරන පනතේ, සංශෝධිත අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ඊට අනුකූල නෛසයි තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලයේ සහ කැළණිය බියගම පාරේ රජමහා විහාර හන්දියේ හි කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බෑන්ක්ස් පී.එල්.සී. (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ).

*නඩු අංකය* : 121/DR.
*ස්වභාවය* : ඩී. ආර්.
*කාර්ය පටිපාටිය* : ලඝු
*වටිනාකම* : රු. 11,000,000/-
*ගම්පහ දිසා අධිකරණයේ ඇස්කිසි අංකය* : 85/19.

..........................*පැමිණිලිකරු.*

*එදිරිව*

හේවාතන්ත්‍රිගේ ප්‍රියංගි අනුෂා පීරිස්, අංක 329, බියගම පාර, සිංහාරමුල්ල, කැළණිය.

..............................*විත්තිකාරිය.*

ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ නියෝගයට අනුව නියත කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශයේ පරිදි විත්තිකාරිය වන හේවාතන්ත්‍රිගේ ප්‍රියංගි අනුෂා පීරිස් යන අය විසින් රු. 2,505,247.02 ක මුදල් සහ 2017 ඔක්තෝබර් මස 17 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා 15% බැගින් වාර්ෂික පොළිය ද, රු. 4,696,004.64ක මුදලක් සහ 2017 ඔක්තෝබර් මස 17 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා 11% බැගින් වූ වාර්ෂික පොලිය ද, රු. 3,313,076.59 මුදලක් සහ 2017 ඔක්තෝබර් මස 17 වැනි දින සිට සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වසරකට 15% බැගින් වූ වාර්ෂික පොළිය ද නඩු ගාස්තු ද විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති අතර එකී ගෙවීම් කිරීමට විත්තිකාරිය අපොහොසත් වූ බැවින් මා විසින් 2019.10.04 වැනි දින තහනමට ගත් විත්තිකාරියට අයත් පහත උපලේඛනයේ විස්තර වන දේපල වර්ෂ 2021ක් වූ මැයි මස 28 වැනි දින පෙ. ව. 11.00ට විත්තිකාරියගේ දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක් (25%) මුදලක් ද පිස්කල් ගාස්තු රජයට අයවිය යුතු ගාස්තු තක්සේරු ගාස්තු වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් හා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

#### දේපලට ප්‍රවේශ වන මාර්ගය

කොළඹ-නුවර පාරේ පැලියගොඩ මංසන්ධියෙන් බියගම පාරට හැරී කිලෝමීටර් 03ක් පමණ පිලපිටිය මංසන්ධියෙන් ඉදිරියට ගොස් වමට ඇති බරණැස් කන්ද පාරේ මීටර් 200ක් පමණ ගිය පසු බරණැස් කන්ද පන්සල අසලින් දකුණට ඇති අඩි 10ක් පමණ පළල පෞද්ගලික පාරේ දකුණු පස ඇති නිවාස දෙකක් පමණ පසු කළ පසු පාරේ අවසානයට මුහුණලා මෙම නිවස පිහිටා ඇත.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ පිලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ 363/ඒ, සිංහාරමුල්ලේ පිහිටි බරනෙස්කන්ද පාරේ වරිපනම් අංක 60/1 දරන (බලයලත් මානක එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා

1989/03/15 වැනි දින කැබලි අංක 3 සහ 4 එකතු කර නැවත බෙදන ලද කෝන්ගහවත්ත නමැති ඉඩමට) බලයලත් මානක පිඹුරුපත් අංක 2990 යටතේ 2013/01/31 වැනි දින මැන බෙද වෙන්කර කැබලි අංක 03 වශයෙන් ලකුණු කර උතුරට : එම්. සෝමරත්න, ගාමිණී සහ මාක්ස් පෙරේරාගේ ඉඩම් වලින් ද, නැගෙනහිරට : මාක්ස් පෙරේරාගේ ඉඩමෙන් ද, දකුණට : රජයේ ඉඩමෙන් ද, බස්නාහිරට : කැබලි අංක 2න් සහ 1න් ද (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කළ) එකී පිඹුරුපත් අංක 2990ට අනුව පර්චස් දොළහකින් (අක්. 0, රූ. 0, පර්. 12) සමන්විත ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු අංක G 54/119හි ලියාපදිංචි කර ඇත.

ජී. එම්. රමනී වීරසිංහ,
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2021ක් වූ මාර්තු මස 26 වැනි දින දී ය.

04-504

---

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට එකඟව පිස්කල් විසින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ නිවේදනය

මොරටුව දිසා අධිකරණයේ දී ය

1994 අංක 09 දරන සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4(1) වගන්තිය යටතේ පවරන ලද නඩුකරය.

නඩු අංකය : DR/149/2019
ස්වභාවය : ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත
වටිනාකම : රු. 13,504,004
ක්‍රියාපටිපාටිය : ලඝු
ඇස්කිසි අංකය : 43/20

අංක 155/ඒ දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08 යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි

(කලින් මොරටුව, රාවතාවත්ත පාර, අංක 45, ''අර්ථ ධර්ම කේන්ද්‍රය'')

සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්

(කලින් ''දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්'' යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ) (සමාගම් අංකය : පී. බී. 3795)

.................*පැමිණිලිකරු.*

*එදිරිව*

සුරේන් කුමාර ලියනගේ,
අංක 38/2, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ
සහ/හෝ
අංක 61/36, දම්බුගහවත්ත පාර, කලල්ගොඩ,
තලවතුගොඩ

....................*විත්තිකරු.*

*සහ දැන්*

1994 අංක 09 දරන පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6(අ)(1) වන වගන්තියෙහි ප්‍රතිපාදන සමග කියවිය යුතු සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 839 වගන්තින් ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමයි.

සුරේන් කුමාර ලියනගේ,
අංක 38/2, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ
සහ/හෝ
අංක 61/36, දම්බුගහවත්ත පාර, කලල්ගොඩ,
තලවතුගොඩ

*නිසි පරිදි ලිපිනය :*
අංක 9C, මාලබේ පාර, කලල්ගොඩ.

*...............විත්තිකාර-පෙත්සම්කරු.*

*එදිරිව*

අංක 155/ඒ දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08 යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි
(කලින් මොරටුව, රාවතාවත්ත පාර, අංක 45 ''අර්ථ ධර්ම කේන්ද්‍රය'')
සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
(කලින් ''දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්'' යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)
(සමාගම් අංකය : පී.බී. 3795)

*........................පැමිණිලිකාර-වගඋත්තරකරු.*

ඉහත අංක දරන නඩුව වර්ෂ 2020.09.03 වැනි දින පැමිණිලිකාර වගඋත්තරකරු සහ විත්තිකාර පෙත්සම්කරු අතර රු. 14,400,000ක මුදලක් සඳහා ඇති වූ සමථය ප්‍රකාරව විත්තිකාර පෙත්සම්කරු විසින් පැමිණිලිකාර වගඋත්තරකරු වෙත කිසිදු මුදලක් නොගෙවීම මත වර්ෂ 2020.12.10 වැනි දින නියත කරන ලද නෛසයයි තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මුදලින් රු, 13,504,004ක මුදලක් සහ රු. 10,144,480ක මුදලක් මත වර්ෂ 2019.03.04 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා 19%ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළියද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශිත දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් එම අනුපාතිකය මතම පොළියද නඩු ගාස්තුද විත්තිකාර පෙත්සම්කරු විසින් පැමිණිලිකාර වගඋත්තරකරුට ගෙවිය යුතු යැයි නියෝග කොට ඇති නමුදු විත්තිකාර පෙත්සම්කරු එකී ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී අධිකරණයෙන් මා වෙත ලද ඇස්කිසි බලපත්‍රයේ බලය මත වර්ෂ 2021.02.23 වැනි දින තහනමට ගත් ඉහත නම් සඳහන් විත්තිකාර පෙත්සම්කරුගේ නිශ්චල දේපළ වර්ෂ 2021ක් වූ මැයි මස 13 වැනි දින පෙ. ව. 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 493-කලල්ගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ කලල්ගොඩ යන ගමේ පිහිටි ඇගැවලන්ද සහ කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. තෙපුලන්ගොඩ විසින් මැන සාදන ලද අංක - 938 සහ 2000.12.07 දරන සැලැස්මේ කැබලි අංක 8බී (බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 3175 සහ 1995.05.20 දරන සැලැස්මේ කැබලි අංක 08 නැවත මැන අනුබෙද සාද ඇත.) දරන කොටසට මායිම්, උතුරට : අගලද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ආර්. දන්තනාරායන මහතාගේ අංක 151 සහ 2000.05.07 සැලැස්මේ කැබලි අංක 08ඒ සහ අංක 3175 සැලැස්මේ කැබලි අංක 04 (අඩි 15ක් පළල පාර) ද, දකුණට : අංක 3175 දරන සැලැස්මේ කැබලි අංක 06, බස්නාහිරට : අංක 3175 දරන සැලැස්මේ කැබලි අංක 07 ද, මායිම් වූ පර්චස් දහය (අ.0, රූ.0, පර්.10)ක් හෙවත් හෙක්ටයාර 0.0253ක් විශාල බිම් ප්‍රමාණය සහ ඊට අයත් ගහකොළ පලතුරු ආදී සියලු දේද වේ. (හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C390/81හි ලියාපදිංචි කර ඇත.)

පහත සඳහන් මාර්ගවලින් ගැණුම්කරු සහ ඔහුගේ පෙර සඳහන් කළ උරුමක්කාරාදීන් සහ ඔහුගේ කුලී නිවැසියන්ට, සේවකයන්ට, කම්කරුවන්ට, අමුත්තන්ට සහ එවැනි අයිතිවාසිකම් ඇති අනිකුත් සියළු දෙනාට සහ ගැනුම්කරුගේ බලයලත් ඕනෑම අයෙකුට පයින් ගමන් කිරීම, වාහන වලින් ගමන් කිරීම, විදුලි කණු සිටුවීම, විදුලි රැහැන් ඇදීම, දුරකථන රැහැන් ඇදීම, ජලනල එලීම, ජලප්‍රවාහන නල එලීම, ආදී සියළු කටයුතු සඳහා යොද ගැනීමේ පරවශතා අයිතීන්ද සමගය. එසේ වුවද ඉහත සඳහන් අයිතීන් භාවිතා කිරීමේදී එකී අයිතිවාසිකම් හිමිකම් ඇති අනෙකුත් අයගේ අයිතිවාසිකම් සමග ගැටීමක් නොවිය යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක - 493-කලල්ගොඩ ග්‍රාම නිළධාරී වසම තුළ කලල්ගොඩ යන ගමේ පිහිටි ඇගැවලන්ද සහ කහටගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 3175 සහ 1995.05.20 දරන සැලැස්මේ කැබලි අංක 04 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 8, 1 සහ 3 ද, නැගෙනහිරට : 9369 සැලැස්මේ කැබලි අංක 2, 3 සහ සී ද, දකුණට : අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කළ කොටසද, බස්නාහිරට : කැබලි අංක 10, 06 සහ 08 ද, මායිම් වූ පර්චස් දොළහයි දශම එක (අ. 0, රූ. 0, පර්. 12.1)ක් හෙවත් හෙක්ටයාර් 0.0306ක් විශාල බිම් ප්‍රමාණය වේ. (හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ C57/79හි ලියාපදිංචි කර ඇත.)

*දේපළට පිවිසීම*.- බොරැල්ලේ සිට රාජගිරිය හරහා පාර්ලිමේන්තු පාරෙන් පැලවත්තට ගොස් එහි කොට්ටාව පාරේ ගිය විට කලල්ගොඩ හන්දිය හමුවේ. එහි වමට ඇති කලල්ගොඩ පාරේ වම්පසට වෙන්නට ඇති දඹුගහවත්ත පාරේ වම්පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක් එදිනම ගෙවිය යුතුය.
2. ඉතිරි 75%ක මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කඩුවෙල දිසා අධිකරණයේ ඇස්කිසි අංකය යටතේ තැන්පත් කළ යුතුය.
3. සියළුම වියදම් ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ විගසම මුදලින් ගෙවිය යුතුය (චෙක්පත් භාරගනු නොලැබේ.)
4. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258(ආ) වගන්තිය ප්‍රකාරව වෙන්දේසි ගාස්තු ගෙවිය යුතුය.

මෙම වෙන්දේසියට අදළ ඔප්පු සහ හිමිකම් ආදී ලියවිලි පරීක්ෂා කිරීම සඳහා පහත අයගෙන් විමසන්න :

කලාපීය කළමනාකරු : සුජිත් අසංක මහතා,
සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්, අංක 155/ඒ දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08
දුරකථන අංක : 011-5666666, 076-4831124

එන්. ඩබ්. කුමාරි චන්ද්‍රලතා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කඩුවෙල.

වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 09 වැනි දින දී ය.

04-750

---

## විවිධ දැන්වීම්

### සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බුද්ධික පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* විභාග සඳහා සූදනම් වන සිසුන් සඳහා දේශන, සම්මන්ත්‍රණ සහ අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම මගින් ඔවුන්ට සහාය වීම ;

*(ආ)* ජනයාගේ බුද්ධි වර්ධනයට අදළ වූ ශාස්ත්‍රීය දේශන, සම්මන්ත්‍රණ, විධායක ක්‍රියාකාරී මග පෙන්වීම, අදළ වූ ප්‍රදර්ශන හා අධ්‍යාපනික, ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම ;

*(ඇ)* පුස්තකාල පහසුකම් ඇති කිරීම හා සියලුම ආකාරයේ ජනසන්නිවේදන (රූපවාහිනී, ගුවන් විදුලි, අන්තර්ජාල, පුවත්පත් හා ප්‍රකාශන) ක්ෂේත්‍රයට අදළ පුහුණු වැඩසටහන් සහ එවැනි ඒකක පවත්වාගෙන යාම ;

යනාදිය වේ.

බුද්ධික පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-671

## සමාධි ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බුද්ධික පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "සමාධි ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* අධ්‍යාපන පහසුකම්වලින් තොර දුප්පත්කමින් පසුවන ළමා, තරුණ පිරිස් සඳහා අධ්‍යාපන කටයුතු සහ පෙර පුහුණු කටයුතු සංවිධානය කිරීම, පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කිරීම ද පොදුජන සුභසාධනයට තරුණ ශ්‍රමය යොමු කිරීම ද ගොවීන් දිරිගැන්වීම හා තරුණ ගොවි සංවිධාන ඇති කිරීම ;

*(ආ)* ප්‍රාග් වෘත්තීය අධ්‍යාපන පුහුණුව, ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව හා නායකත්වය, පරිගණක, ජනසන්නිවේදනය, දමිළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂා පුහුණුවට ඉඩ ප්‍රස්ථා ලබා දීම ;

*(ඇ)* ජනයාගේ බුද්ධි වර්ධනයට අදළ වූ ශාස්ත්‍රීය දේශන, සම්මන්ත්‍රණ, විධායක ක්‍රියාකාරී මග පෙන්වීම, අදළ වූ ප්‍රදර්ශන හා අධ්‍යාපනික ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම ද පුස්තකාල පහසුකම් ඇති කිරීම ද පරිසර සංරක්ෂණය හා තුලනාත්මක සංවර්ධනය කෙරෙහි මූලිකත්වය ගෙන කටයුතු කිරීම ;

යනාදිය වේ.

බුද්ධික පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-672

---

## සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බුද්ධික පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ථෙරවාද බෞද්ධ දර්ශනය ඇතුළත් බෞද්ධ සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කිරීම ;

*(ආ)* භාවනා/යෝගා පුහුණුව ලබා දීමට දිවයින පුරා ශාඛා ව්‍යාප්ති කිරීම ;

*(ඇ)* සුනාමි/ගංවතුර වැනි ජාතික ව්‍යසනයන්ට ලක්වූවන්ට ආධාර ලබා දීම ;

යනාදිය වේ.

බුද්ධික පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-673

---

## නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බුද්ධික පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53(1) යටතේ "නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීමයි :-

1. ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික අධ්‍යාපනය ප්‍රවර්ධනයේ අරමුණින් එම දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය පහසුකම් අදල ආයතනවලට භෞතිකව හා ගුණාත්මකව ආධාර ලෙස ලබාදීමත් ;

2. තාරුණ්‍ය සංවර්ධනය කිරීමේ අරමුණින් අවශ්‍ය මූලික පහසුකම් සැපයීම හරහා, පළාත්, දිස්ත්‍රික් හා ග්‍රාමීය මට්ටමින් ඔවුන්ගේ ක්‍රීඩා, භාෂා, කලා හා සංස්කෘතික දක්ෂතා ඔප් නැංවීමට පෙළඹවීමටත් ;

3. විෂය බාහිර සහ සංස්කෘතික දක්ෂතා ප්‍රවර්ධනය අරමුණින්, පාසල්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ගේ දක්ෂතා ප්‍රචාරය සහ අගය කිරීමට තෑගි සහ සහතික පත්‍ර ප්‍රදනය කිරීමට අවශ්‍ය පියවර සැපයීමටත් ;

යනාදිය වේ.

බුද්ධික පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මාතර දිස්ත්‍රික්කය.

04-674

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.